**ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල - 2014**

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ (432 අධිකාරියේ) 5 සහ 9 වගන්ති ප්‍රකාර පනවන ලද රෙගුලාසිවල 6 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 අහිතකර මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) ගුරු විශ්‍රාම වැටුප් දායක අරමුදල සඳහා බැර වියයුතු රු. 37,412,681 ක් වූ මුදල ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) අරමුදල සඳහා වයඹ, දකුණ හා නැගෙනහිර යන පළාත් තුනෙන් දායක මුදල් අරමුදලට බැර වී නොතිබුණු අතර එම පළාත් වලින් වර්ෂයට අදාල සම්පූර්ණ දායක මුදල් ගණනය කර තවදුරටත් ලැබිය යුතු දායක මුදල් හඳුනාගෙන එම වටිනාකම් ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) අරමුදල සඳහා චෙක්පත් මඟින් දායක මුදල් ප්‍රේෂණය කරනු ලබන අර්ධ පෞද්ගලික පාසැල් දෙකක සමාලෝචිත වර්ෂයට අදාල මාස 5 ක ලැබිය යුතු දායක මුදල හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාලව වැඩිපුර ගණනය කරන ලද බදු වියදම රු. 3,091,571 ක් අතීතානුයෝගීව ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන තිබුණි.

(ඉ) ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 253 දරන විසර්ජන ශීර්ෂයෙන් ගෙවනු ලබන අතර, එකී වියදම හඳුනාගෙන අරමුදලේ වියදම ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

1953 අංක 44 දරන පායශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත අනුව පනවන ලද නියෝග අංක 9 (අ) ප්‍රකාරව එක් එක් දායක මුදල් ගෙවන්නෙකුගේ හා ඔවුන්ගේ පවුල් සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි තොරතුරුද, අරමුදල සඳහා ගෙවන ලද සියළු දායක මුදල් පිළිබඳ විස්තරද ඇතුළත් ලේඛන පවත්වා ගත යුතු වුවත්, එවැනි ලේඛන පවත්වා නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය රු. 120,273,433 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 137,046,345 ක්, වූයෙන් ඉකුත්

වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 16,772,912 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. දායක මුදල් ආපසු ගෙවීම් රු. 887,033 කින් එනම් සියයට 11 කින් ඉහළ ගියද, පොළී ආදායම රු. 5,049,348 කින් එනම් සියයට 8 කින් හා දායක මුදල් ලැබීම් රු. 15,139,795 කින් එනම් සියයට 16 කින් පහළ යාම, මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දායක මුදල් ප්‍රේෂණය කළ යුතු පිරිවෙන් හා අර්ධ පෞද්ගලික පාසැල්වල තොරතුරු සහ ලැබුණු මාසික මුදලේ නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා අරමුදල සතුව ප්‍රමාණවත් වූ වැඩපිළිවෙලක් නොතිබුණි.

(ආ) අරමුදලේ සාමාජික සංඛ්‍යාව, සමාලෝචිත වර්ෂය තුළ නව සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව හා අරමුදලේ සාමාජිකත්වයෙන් ඉවත් වූ සංඛ්‍යාව පිළිබඳ විස්තර පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ඇ) මාසික සාමාජික දායක මුදල් ලැබීම් රු. මිලියන 5 සිට රු.මිලියන 10.8 අතර පරාසයක පැවතුන අතර එක් එක් මාසයන්හි දායක මුදල් ලැබීම්වල උච්චාවචනයන් නිරීක්ෂණය විය. මාසික ලැබිය යුතු දායක මුදල කොපමණද යන්න ගණනය කිරීමේ ක්‍රමවේදයක් අරමුදල සතුව නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 51.9 ක පොළී ආදායමක් අරමුදලට ලැබී තිබුනද, එම මුදලින් අරමුදලේ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා කිසිදු මුදලක් යොදා ගෙන නොතිබු අතර අරමුදලේ අවිවාහක දායකයින්ගේ මුදල් ආපසු ගෙවීම සඳහා රු. මිලියන 8.6 ක් වැය කර ඉතිරි රු. මිලියන 43.3 ආයෝජනය කර තිබුණි.

### 4.2 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් මඟින් අරමුදලක් ගොඩනගා එමඟින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කළ යුතු වුවත්, 253 වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන මඟින් උක්ත වියදම් දැරීම හේතුවෙන් මෙම අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු වී නොතිබුණි. ඒ නිසා මෙම අරමුදල පවත්වා ගෙනයාමේ ප්‍රතිඵලදායි බවක් නොමැති බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින්වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) විශ්‍රාම වැටුප් පද්ධති කළමනාකරණය
(ඇ) ආයෝජන